නුවරඑළිය ප්‍රාදේශීය සභාව - 2013
නුවරඑළිය දිස්ත්‍රික්කය
-----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 22 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ඔක්තෝබර් 21 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 අහිතකර මතය
----------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
-----------------------------------------

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම.
-----------------------------------------------------------------------

ප්‍රදේශීය සභාව සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙලකර ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති.
-------------------------

ප්‍රාදේශීය සභාව සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන සමඟ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා පදනම් කරගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති අනාවරණය කර නොතිබුණි.

1.3.3 ගිණුම්කරණ අඩුපාඩු.
-----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාළ පිළිවෙලින් රු.7,491,257ක් සහ රු.12,533,371ක උසාවි දඩ මුදල් සහ මුද්දර ගාස්තු ආදායම් රු.5,017,545ක් සහ රු.5,617,956ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.9,389,127කින් අඩුවෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පිළිවෙලින් රු.2,502,749ක් හා රු.9,862,546ක උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු රු.8,344,596ක් හා රු.3,351,049ක් ලෙස දැක්වීම හේතුවෙන් ජංගම වත්කම් එකතුව රු.669,650කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ). කර්මාන්ත ණයගැතියන් වශයෙන් ජංගම වත්කම්වල දක්වා ඇති රු.49,.242,233ක මුදල තුළ සහා අරමුදල් මගින් 2013 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර තිබූ කර්මාන්තවල රු.12,329,969ක ඇස්තමේන්තු වටිනාකම ඇතුළත්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැතියෝ සහ ප්‍රාග්ධන වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ). සමාලොචිත වර්ෂයට අදාළ විගණන ගාස්තු සඳහා වූ ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඉ). සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුමේ රු.4,667,795ක ශේෂය රු.4,657,795ක් ලෙස දැක්වීම හේතුවෙන් දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් රු.10,000ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ). පළාත් පාලන ගිණුම් ක්‍රමය අනුව එක් එක් වැය විෂයන්වල හා එක් එක් ආදායම් විෂයන්වල ගෙවීම් හා ලැබීම් සාරාංශගත ශේෂයන් වලින් ලබාගෙන ගිණුම්ගත කළ යුතු වුවත්, සමාලොචිත වර්ෂයේ මුදල් පොත සමඟ හර හා බැර වශයෙන් සාවද්‍ය සටහන් යොදා ජනල් සටහන් 32ක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණි.

(උ). 2012 වර්ෂයේ පොදු මුදල් ගිණුමෙන් කර්මාන්ත මුදල් ගිණුමට මාරුකරන ලද රු.5,412,723ක මුදල් නොපියවූ අත්තිකාරම් වශයෙන් සටහන් කර තිබුණ අතර එය නිවැරදි කිරීමේදී අදාළ වියදම් ගිණුම් හර කර අත්තිකාරම් ගිණුම බැර කළ යුතු වුවත් සාවද්‍ය ලෙස මුදල් ගිණුම හර කර අත්තිකාරම් ගිණුම බැර කර තිබුණි.

(ඌ). සමාලොචිත වර්ෂයේ අවසානයට ආපසු ගෙවිය යුතු රු.2,719,406ක තැන්පතුවල වටිනාකම රු.8,198,656ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂය අවසානයේ ජංගම වගකීම් රු.5,479,250ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

1.3.4 නොසැසඳූ පාලන ගිණුම්.
-----------------------------

සභාවේ පවත්වාගෙන යනු ලබන උපයෝගී ලේඛන 05ක ශේෂ අදාළ පාලන ගිණුම්වල ශේෂ සමඟ සැසැඳීමේදී රු.15,896,661ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.5 අවිනිශ්චිත ගිණුම්.
--------------------

2013 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය රු.69,944,595ක් විය.

1.3.6 ලැබිය යුතු ගිණුම්
--------------------

2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.53,954,452ක් වූ අතර ඒ තුළ වූ අවුරුදු 01ක කාලයක් ඉක්මවූ ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.644,216ක් වී තිබුණි.

1.3.7 ගෙවිය යුතු ගිණුම්
---------------------

2013 දෙසැම්බර් 31 දිනට අවු:01ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 03ක එකතුව රු.18,569,477ක් වී තිබුණි.

1.3.8 විගණනය සඳහා සාක්ෂි නොවීම.
----------------------------------

(අ) අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එකතුව රු.106,167,586 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස පිළිගැනීමට නොහැකි විය.

(ආ) ප්‍රාදේශීය සභාව සතු ඉඩම් කොටස් 33ක් බාහිර පාර්ශවයන් වෙත බදුදී තිබූ අතර ඉන් කොටස් 15කට අදාළ බදු ගිවිසුම් විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගෙන තිබූ රු.61,005ක් වටිනා කලිසම් 49ක් හා රු.7,470ක් වටිනා වැහිකබා 06ක් නිකුත් කිරීම පිළිබඳ කිසිදු සාක්ෂියක් විගණනයට අනාවරණය නොවුණි.

1.3.9 නීති රීති රෙගුලාසි වලට අනුකූල නොවීම.

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ). 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) රීති සංග්‍රහයේ 5 වෙනි රීතිය | ශාන්තිපුර නැරඹුම් මැදිරිය පිහිටි ඉඩමේ පර්චස් 24.19ක් වසර 08ක කාලයක් තුළ බාහිර පුද්ගලයන් විසින් පරිහරණය කරමින් පැවතුණි. |
| (ආ). මධ්‍යම පළාතේ පළාත් පාලන කොමසාරිස්ගේ 01/2013 හා 2013/04/05 දිනැති චක්‍රලේඛය | තමාගේ හෝ ඉල්ලාගත් හෝ මෝටර් රථයක් යතුරු පැදියක් හෝ ත්‍රී වීලරයක් නොමැති මහජන නියෝජිතයන් 10 දෙනෙකුට සමාලෝචිත වර්ෂය තුළ ඉන්ධන දීමනා වශයෙන් රු.250,000ක් ගෙවා තිබුණි. |
| (ඇ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 189,486 හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 31 | අවස්ථා 06කට අදාළ එකතුව රු.17,543ක් වටිනා අගරු චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ඈ). ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371 | අවස්ථා 45කදී ගෙවා තිබූ එකතුව රු.4,657,794ක් වූ අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවාගෙන නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,136,840ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.15,072,463ක් වී තිබුණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

(අ). සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය හා සමඟ සැසඳීමේදී රු.5,935,623ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා වරෙන්තු ගාස්තු හා දඩ සියයට 20කින් අඩුවීම හා වියදම් විෂයයන් 04ක වියදම සියයට 16ත් 60ත් අතර පරාශයක් නිරීක්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

-----------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

-----------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම රු. '000 | තථ්‍ය ආදායම රු. '000 | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟ ආදායම රු. '000 |
|---|---|---|---|---|
| I. | වරිපනම් හා බදු. | 7,990 | 3,024 | 4,966 |
| II. | බදු කුලී. | 4,523 | 3,480 | 1,043 |
| III. | බලපත්‍ර ගාස්තු | 3,514 | 3,514 | - |
| IV. | වෙනත් ආදායම්. | 2,400 | 2,108 | 292 |

2.3.2. කඩ කුලී

---------

සභාව සතු කඩ කාමර සඳහා ආදායම් පරීක්ෂකගේ තක්සේරුව මත රු.30 හා 50 වැනි අවම මාසික කුලියක් අයකරගෙන තිබුණි. කොටගල වෙළඳ සංකීර්ණය, රොසිටා දිනපතා පොළ සහ රොසිටා නවීන කඩකාමර සඳහා 1987 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන කඩකුලී අයකිරීම නිසා සභාවට ලැබිය යුතු විශාල ආදායමක් අහිමිවී තිබුණි.

2.3.3 ඉඩම් බදු

---------

සභාව සතු ඉඩම් කොටස් 33ක් සඳහා වසර 17කට වඩා පැරණි තක්සේරුවක් පදනම්කරගෙන බදු අයකරමින් පැවතුණි.

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

2013 දෙසැම්බර් 31 දිනට මධ්‍යම පළාත් සභාවෙන් ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තුවල වටිනාකම රු.12,364,797ක් වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.

----------------------------------

(අ) සභා බලප්‍රදේශයට අයත් ලිදුල ෆාමස්ටන් ඉඩම වෙන්දේසි කිරීම සඳහා සභාව ඉඩම් අනුබෙදීම අනුමත කර සංවර්ධන බලපත්‍රයක් ලබාදී තිබුණද සභාවට පැවරිය යුතු ඉඩම් කොටස් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලවීම තහවුරු කරගැනීම සඳහා පිළියෙල කර තිබූ පාලන වාර්තා මගින් භෞතික හා මූල්‍ය කාර්යය සාධනය සංසන්දනය කිරීමට නොහැකි විය.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය
-------------------------

i. සභා බලප්‍රදේශයේ සොහොන් බිම් 05ක් සඳහා සමාලෝචිත වර්ෂයේදි කම්බි වැට යෙදීම සඳහා සැලැස්මක් රහිතව මිලදීගෙන තිබූ රු.680,250ක් වටිනා ද්‍රව්‍ය අතුරින් රු.51,900ක් වටිනා සිමෙන්ති මළු 48ක් හා වැලි කියුබ් ½ක් මාස 06කට අධික කාලයක් ප්‍රයෝජනයට නොගැනීම නිසා විනාශ වී තිබූ බව 2014 මැයි 20 දින කරන ලද භෞතික පරීක්ෂාවේදි අනාවරණය විය.

ii. සභා අරමුදල් මගින් නාගසේන පුස්තකාලය ඉදිකිරීම සඳහා රු.3,592,171ක ඇස්තමේන්තුවක් පිළියෙල කර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2001.02.23 දින අංක 352/12 සහ 2002.03.04 දින අංක 352/19 දරන චක්‍රලේඛ මගින් හඳුන්වා දී ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන උල්ලංඝනය කරමින් බලප්‍රදේශයේ සමිති දෙකක් වෙත පවරා තිබුණි. එම කොන්ත්‍රාත්තුවලට අදාළ 20% අත්තිකාරම් වශයෙන් රු.718,434ක මුදලක් 2013 දෙසැම්බර් 31 දින අදාළ සමිති වලට ගෙවා තිබුණද, පරීක්ෂණ දින වන විට අත්තිකාරම ලබාදී මාස 05කට අධික කාලයක් ඉක්මවා තිබුණ නමුත් කිසිදු ඉදිකිරීමක් කර නොතිබුණ බව 2014 මැයි 22 දින කරන ලද භෞතික පරීක්ෂාවේදි අනාවරණය විය.

iii. සභා අරමුදල් මගින් නාගසේන පුස්තකාලය සඳහා රු.28,951ක් වියදම්කර ඉදිකර තිබූ ගේට්ටුව මාස 05ක් ඉක්මවා යන්නට පෙර ප්‍රයෝජනයට ගත නොහැකි බැවින් ගලවා ඉවත්කර තිබුණි.

iv. කඳපොල මහජන වැසිකිළියේ රැඳවුම් බැම්ම හා ළිඳ ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේ රු.592,028ක හා 2013 වර්ෂයේ රු.1,093,918ක් වශයෙන් එකතුව රු.1,685,946ක මුදලක් සඳහා සමිති 02ක් සමඟ ගිවිසුම්ගතවී රු.500,000ක් අවස්ථා 03කදී සමිති 2ක සඳහා ගෙවා තිබූ අතර, කර්මාන්තයට අදාළ බැම්ම ඉරිතලා පුපුරා ගොස් තිබූ බැවින් සමස්ථ ව්‍යාපෘතියම අසාර්ථක වී තිබූ බව 2014 මැයි 22 දින කරන ලද භෞතික පරීක්ෂාවේදි නිරීක්ෂණය විය.

3.3 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාද
-----------------------------------

පහත සඳහන් ව්‍යාපෘති 2014 අප්‍රේල් 30 දින වන විටත් නිමකර නොතිබුණි.

| විස්තරය | ගිවිසුම් ගත මුදල | ගිවිසුම් අත්සන් කළ දිනය | නිම කළ යුතු දිනය | මූලික ගෙවීම |
|---|---|---|---|---|
| | රු. | | | රු. |
| i. බගවන්තලාව පෙර පාසල සංවර්ධනය | 184,558 | 30.12.2013 | 30.01.2014 | 50,000 |
| ii. ඩයගම නගරයේ සීමා වැට ඉදිකිරීම | 363,059 | 20.12.2013 | 20.02.2014 | 66,000 |
| iii. කඳපොල මහජන වැසිකිළියේ රැඳවුම් බැම්ම සහ ළිඳ ඉදිකිරීම | 1,110,000 | 30.09.2013 | 30.11.2013 | 395,011 |
| iv. නාගසේන පුස්තකාලය ඉදිකිරීම පළමු අදියර | 1,975,059 | 20.12.2013 | 20.03.2014 | 395,011 |
| v. නාගසේන පුස්තකාලය ඉදිකිරීම දෙවන අදියර | 1,950,005 | 30.12.2013 | 20.03.2014 | 323,422 |
| vi. බෝක්කු ඉදිකිරීම - තලන්කන්ද වත්ත | 273,447 | 27.12.2013 | 27.01.2014 | 49,717 |
| vii. පාර්මස්ටන් වත්ත බොක්කු ඉදිකිරීම | 25,000 | 19.06.2013 | 19.07.2013 | 12,500 |
| viii. බෙයාර්වෙල් මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 99,727 | 26.11.2013 | 26.12.2013 | 19,945 |
| ix. ධර්මපාල පුර වන්දන මාවත කොන්ක්‍රීට් | | | | |

| | | | | |
|---|---|---|---|---|
| කිරීම | 50,000 | 20.12.2013 | 20.12.2013 | 29,086 |
| x. කඳපොල 6 කණුව බස්නැවතුම්පල ඉදිකිරීම | 95,000 | 06.12.2012 | 06.01.2013 | 20,000 |
| xi. මෙරායා පුස්තකාල ගොඩනැගිල්ලේ තාප්පය හා ආරක්ෂක කාමරය ඉදිකිරීම | 205,210 | 08.11.2012 | 08.12.2012 | 41,042 |

3.4 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය
---------------------------------

ප්‍රාදේශීය සභාව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබූ අතර, පරිසරයට හානිකර පරිදි කසළ, කඳපොල, රාගල පාර, උඩුපිහිල්ල, නානුඔය, සහ කොටගල ආදාහනාගාරය යන ස්ථාන අසලට බැහැර කරමින් පැවතුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
-----------------------------------------

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම
------------------------------

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම විගණනයට ඉදිරිපත් කර තිබුණි.

4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම
-------------------------------

සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි

4.3 අයවැය පාලනය.
------------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු අයවැය ලේඛණයට අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තත්‍ය ආදායම් හා වියදම් සමඟ සැසැඳීමේදී ආදායම් විෂයයන් 07ක සියයට05 සිට සියයට 89 දක්වාද වියදම් විෂයයන් 07ක සියයට 03 සිට සියයට 238 දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණි.

4.4 නොවිසඳී ඇති පිළිතුරු නොළත් විගණන විමසුම්.
----------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 18කට පිළිතුරු ලබාදී නොතිබුණි.

4.5 අභ්‍යන්තර විගණනය
----------------------

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. පද්ධති හා පාලන.
--------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය.
(ආ). අභ්‍යන්තර පාලනය.
(ඇ). ආදායම් පරිපාලනය
(ඈ). ණයගැති ණයහිමි පාලනය.
(ඉ). වත්කම්වල කළමනාකරණය.